

ලියා දන්වන වග යි

## අභියෝගය

ශ්‍රී ලංකාව තරම් ප්‍රජාතන්ත්‍රවාදය යන සංකල්පය කුණුහරුපයක් බවට පත් කරගත් රටක් මුලු ආසියාකරයේම තවත් නොමැති තරම් ය. දවසේ තුන් තිස් පැය පුරාම හොඳට මෙන්ම නරකට ආරක්ෂාවක් සේ පාලකයන් මතුරණ මේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන යම් හෝ කතිකාවක යෙදීමට කාලය මේ යයි අපට හැඟේ. ප්‍රජාතන්ත්‍රවාදය ගැන ලොව පුරා දර්ශනවාදීන් හා දේශපාලන නායකයන් විවිධ අර්ථකතන දී තිබේ. ඒබ්‍රහම් ලින්කන්, මහජනයා විසින් මහජන-යා උදෙසා පවත්වාගන්නා මහජන පාලන ක්‍රමයක් ලෙස ද, සීලර් සියලු දෙනාටම අයිතිවාසිකම් හිමි ආණ්ඩුක්‍රමයක් ලෙසද එය හඳුන්වා දී තිබේ. ආතර් ලුවීට අනුව ප්‍රජාතන්ත්‍රවාදයට අර්ථ දෙකකි. එය බහුතරයේ කැමැත්ත හා තීරණ ගැනීම සඳහා කෙළින්ම හෝ නියෝජිතයන් මගින් හෝ සහභාගිවීමට ඇති අවකාශය තිබිය යුතු වීම ලෙසද වේ. මේ සියල්ලෙහි සරල අර්ථය නම් ජනතාවගේ කැමැත්තෙන් ජනතාව ආණ්ඩු කිරීමයි.

ඉංග්‍රීසියෙහි එන ඩිමොක්‍රසි නමැති වචනයේ අර්ථය ප්‍රජාතන්ත්‍රවාදය ලෙස අප හැඳින්වුව ද එම වචනය ගොඩ නැගී ඇත්තේ ඩිමෝස් හා ක්‍රාටියා යන ග්‍රීක වචන දෙක එකතු වීමෙනි. ඩිමෝස් යනු ජනතාවයි. ක්‍රාටියා යනු පාලනයයි. එනම් ජනතාවගේ පාලනයයි.

රටක ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක වීමට නම් සැපිරිය යුතු සාධක කීපයක් තිබේ. ජනතාවගේ නිදහස ඉන් මූලික වෙයි. දේශපාලන ආර්ථික හා ආගමික නිදහස ප්‍රමුඛ කාරණා යි. අධිකරණයේ ස්වාධීනත්වය, නීතියේ ස්වාධිපත්‍යය, ජනමාධ්‍ය නිදහස ද එයට ඇතුළත් ය. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක දේශපාලන නිදහසට ඇති වැදගත්කම බොහෝ ය. රටක පාලන කටයුතු වලට ජනතාවට සහභාගි වීමට ඇති අයිතිය දේශපාලන නිදහස වෙයි. මැතිවැරණයකදී තම නියෝජිතයන් පත්කර ගැනීමට ඇති අයිතිය විරෝධතා, රැස්වීම් පැවැත්වීම්, සාකච්ඡා, සම්මුති, විරුද්ධ මත ඉවසීම, බහුතර මතයට ඉඩ දීම, මෙහිලා ඉතා වැදගත් වේ.

ප්‍රජාතන්ත්‍රවාදය බහුතර මතය අනුව ක්‍රියාත්මක වන පාලන ක්‍රමයකි. එහිදී රජයන් තම මතයට මෙන්ම විරුද්ධ මත වලටද එක සේ සැළකිල්ලක් දැක්විය යුතු ය. එසේම ප්‍රජාතන්ත්‍රවාදය තුළ ජනතාවට අයුක්තියට, අවනීතියට එරෙහිවීමට ඇති අයිතිය ද සපුරා සහතික කොට තිබේ.

නිදහස ලැබීමෙන් පසු ගොඩනැගුණ කිසිදු රජයක් හෝ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් නිසි ලෙස සුරැකුවේ යයි අපට කිව නොහැකි ය. එසේ වුව ද ශ්‍රී ලංකාව තුළ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සුරැකීම සඳහා යම් ජනමතයක් ගොඩ නැගෙමින් ති.බෙන බව මෑතක සිට අපට දැක ගත හැකිය. ඒ සඳහා ගොඩනැගෙන සංවිධානයක් සැබෑ ලෙසම ප්‍රජාතන්ත්‍රවාදය ගොඩ නැගීමට සූදානම් වන්නේ නම් අයිතීන් සුරැකීමේ සටනට පෙර තමන්ගේ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් කවරේද යන්න ගැන ජනතාවට අවබෝධ කිරීම පළමු කොට කළ යුතු ය.

අද දවසේ අප හමුවේ ඇති ප්‍රධානම අභියෝගය එය යයි අපි සිතමු.

## වමේ කොන්ද

වමේ පක්ෂ වල කොඳු නාරටි තවමත් බිඳී නැති බව පෙන්වා දෙමින් ජනාධිපතිධුර කාලය දික් කිරීමට එරෙහිව නැගී සිටින්නට වමේ පක්ෂ ගෙන ඇති තීරණය අපේ සතුටට හේතු වෙයි. ඔවුන්ගේ ඒ ක්‍රියාවලිය අගය කිරීමෙන් පමණක් නොනැවතී ක්‍රියාත්මක තලයේදී ඊට අවශ්‍ය සහය නොඅඩුව ලබා දීමට ප්‍රගතිශීලී යයි කියා ගන්නා රජයේ සහ විරුද්ධ පක්ෂවල පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා සංවිධාන පෙරමුණ ගත යුතුව තිබේ.


සන්නස
අන්තර්ජාලයෙන් කියවන්න
www.sannasa.net






සන්නස

**සංස්කරණය / Editor**

අසෝක සුබසිංහ
Asoka Subasinghe

**උපදේශක සංස්කාරක / Advisory Editor**

ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක /Asst. Editor**

ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**

අසෝක සිල්වා Asoka Silva

**සන්නස පිරිවර**

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සම්බන්ධීකරණය**

| | |
|---|---|
| **NSW** Lakshman Kodituwakku 02 9626 7660 02 9837 5055 | **WA** Kapila Hemantha Balage 08 9456 1972 |
| **QLD** Ananada Samaratunga 07 3372 7953 | **ACT** Asoka Nimalasiri 0400 429 031 |
| **SA** Chandra Eeriyagama 08 8331 2318 | |



**Sannasa**
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasanews@gmail.com
Tel/Fax : 03 3796 4241



පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත


## සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න අනන්‍යතාව හෙළි නොකර එවන ලිපි සඳහා පුවත්පතේ ඉඩක් නොලැබෙන බවද කරුණාවෙන් සළකන්න .